# කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තාව

එම්.කේ.එන්. දමයන්ති

## සංක්ෂේපය

වර්තමානයේ සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවන් අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ඒ තුළින් කාන්තාවන් මුහුණදෙන ගැටළු සහ දුෂ්කරතා, කාන්තා අයිතිවාසිකම් කඩවීම්, කාන්තාව සම්බන්ධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයේ ක්‍රියාකාරකම් වඩාත් ඉස්මතු වී ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විවරණය කරන විට සම්පූර්ණයෙන්ම සමාජ නිර්මිතයකි. ලිබරල්, මාක්ස්වාදී, සමාජවාදී, රැඩිකල්, මනෝ විශ්ලේෂණවාදී, පශ්චාත් නූතනවාදී යනාදී විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තත්ත්වය විග්‍රහයට ලක් කරනු ලැබ ඇති අතර මෙම න්‍යායාත්මක කරුණු තුළ යම් යම් සමානතා මෙන්ම අසමානතාවන්ද පෙන්නුම් කරනු ලබයි. කෙසේ වුවද, කුමන දෘෂ්ටිකෝණයකින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස් ඉදිරිපත් වුවත්, මූලික වශයෙන් මෙයට ප්‍රස්තුත වී ඇත්තේ මනුෂ්‍යයෙකු උත්පත්තියේදී ලබන ස්ත්‍රී හෝ පුරුෂ ප්‍රභේදනය මුල්කර ගනිමින් ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට වෙනස් අන්දමට සැලකීම පිළිබඳව වූ සමාජ නිර්මිතයයි. පුද්ගලයන්ගේ උත්පත්තියේදී හිමිවන ජීව විද්‍යාත්මක බෙදීම පිළිබඳ මූලිකව සලකා සමාජයීය වශයෙන් කාලාන්තරයක් තිස්සේ ගොඩ නගනු ලැබූ මෙම තත්ත්වය ස්ථාවර දෙයක් නොවන අතර සමාජයීය ආකල්ප, ආගමික මතවාද, මිත්‍යා විශ්වාස ආදී විවිධ සාධකවල වෙනස්කම් අනුව කාලානුරූපීව වෙනස්වන එසේම වෙනස්කළ හැකි තත්ත්වයකි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුකර ගනිමින් කාන්තාවන් සහ පුරුෂයින්ට අසමාන ලෙස සැලකීම, අසමාන තත්ත්වයන් ලබාදීම, කාන්තාවන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවීම තුළ කාන්තා අයිතිවාසිකම් අහිමිවීමක් විවිධ සමාජ තත්ත්වයන් තුළදී සිදුවේ. වර්තමානය වනවිට මෙවැනි තත්ත්වයන් සම්බන්ධව විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානත් අන්තර්ජාතික ආයතනත් ලොව පුරා විවිධ ක්‍රියාකාරකම්හි නියැලී සිටී. මෙයට අමතරව සිවිල් සමාජයද මේ පිළිබඳව කිසියම් උනන්දුවක් දක්වන බව පෙනේ. මෙම ලිපිය තුළින් එම කාලීන මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්ත්වය මෙන්ම වෙනත් රටවල කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳවද අධ්‍යයනය කෙරේ. මෙහිදී විශේෂ අවධානයක් කෘෂිකාර්මික ක්ෂේත්‍රය කෙරෙහි යොමු කරනු ලබයි. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් මුහුණපානු ලබන විවිධ ගැටළු කෙරෙහිද ඒවාට පිළියම් වශයෙන් රාජ්‍යයන් විසින් ගෙන ඇති පියවරයන් පිළිබඳව ද අවධානය යොමුකරනු ලබයි.

# හැඳින්වීම

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය ( Gender )

සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විවරණය කරන විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තත්ත්වය සම්පූර්ණයෙන්ම සමාජ නිර්මිතයකි. මෙය ජීව විද්‍යාත්මක පදනමක් මත ඉදිරිපත්වන විග්‍රහයක් නොවන අතර මනුෂ්‍යයකු උත්පත්තියේදී ලබන ස්ත්‍රී හෝ පුරුෂ ප්‍රභේදනය මුල්කරගත්, ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට වෙනස් අන්දමට සැලකීම පිළිබඳ සමාජ නිර්මිතයක් මෙයින් අදහස් කෙරේ. එනම් ස්ත්‍රිය, ස්ත්‍රියක වීම නිසාම දෙවැනි ගණයේ පුරවැසියෙකුගේ තත්ත්වයෙහිලා සැලකීම මෙන්ම විවිධ අවස්ථාවන්හිදී නොසළකා හැරීම්වලට ලක්කිරීම ආදී කරුණු රාශියක් මෙයින් අදහස් වේ. මානව හිමිකම්වල ප්‍රධාන කරුණක් ලෙස සැලකෙන සියළු මානවයන් සමාන තත්ත්වයෙහිලා සැලකීම මේ තුළින් උල්ලංඝනය වන අතර පවුල, සමාජය, විවිධ ආයතන හෝ රාජ්‍යය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තා අයිතිවාසිකම් පැහැර හැරීමත් සිදුවිය හැක. ඇතැම් විට කාන්තාව විසින්ම තමා නොදැනුවත්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා තම අයිතිවාසිකම් නොසළකා හැරීමකට හෝ අත්හැරීමකට ලක්කිරීම සිදුවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විවිධ ගුරුකුලයන්හිදී විවිධාකාරයට සාකච්ඡා කරනු ලබයි.

## කෘෂිකාර්මික සමාජයේ කාන්තාව

කෘෂිකාර්මික සමාජයන්හි කාන්තාවෝ පුරාතනයේ සිට ආර්ථික සහ ගෘහස්ථ භූමිකාවන් අතර වර්ගීකරණයකින් තොරව ආර්ථික නිෂ්පාදනයට දායක වූහ. ශ්‍රී ලංකාව නිදහස ලබන අවධිය වන විට ශ්‍රී ලාංකික කාන්තාවෝ බොහෝ දෙනෙක් කෘෂිකර්මාන්තය සහ වැවිලි ක්ෂේත්‍රය තුළ සහාය නිෂ්පාදකවරු වී සිටියහ. ශ්‍රී ලංකාවද ඇතුලත්ව දකුණු ආසියාතික රටවල තවදුරටත් කාන්තා ' නිල ශ්‍රම බලකායෙන් 'සැලකියයුතු පිරිසක් කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව සේවා නියුක්තව සිටිති. මෙම රටවල ශ්‍රම බලකායේ කෘෂිකාර්මික කටයුතුවල නියුක්ත පිරිමි ප්‍රතිශතයට වඩා කාන්තා ප්‍රතිශතය ඉහළ අගයක් පෙන්නුම් කරනු ලබයි.

## දකුණු ආසියාතික රටවල් කිහිපයක කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ත ස්ත්‍රීන් සහ පුරුෂයින් ප්‍රතිශත ය.

| | පිරිමි ශ්‍රම බලකායේ % ලෙස පිරිමින් | | කාන්තා ශ්‍රම බලකායේ % ලෙස කාන්තාවන් | |
|---|---|---|---|---|
| **රට** | **1980** | **1992-1997** | **1980** | **1992-1997** |
| ශ්‍රී ලංකාව | 44 | 33 | 51 | 40 |
| ඉන්දියාව | 63 | දත්ත නොමැත | 83 | දත්ත නොමැත |
| පකිස්ථානය | දත්ත නොමැත | 44 | දත්ත නොමැත | 67 |
| බංග්ලාදේශය | 67 | 54 | 81 | 78 |
| නේපාලය | 91 | දත්ත නොමැත | 98 | දත්ත නොමැත |

**මූලාශ්‍ර** - World Development Indicators- **2000**

ඉහත දත්ත අනුව 1980 වර්ෂයට වඩා 1992-97 කාලයේදී ශ්‍රී ලංකාවේ සහ බංග්ලාදේශයේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ත ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අඩුවීමක් දැකිය හැකිය. 1972 දී ශ්‍රී ලංකාවේදී කෘෂිකාර්මික, වන සහ ධීවර අංශයේ සේවයේ නියුතු ශ්‍රම හමුදාවෙන් 50.2% ක් කාන්තාවන් වූ අතර 2000 වර්ෂය වන විට එය 37.8% දක්වා පහළ බැස ඇත. එනමුත් 2000 වසර වන විටද ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්ත කාණ්ඩ අනුව සළකා බැලීමේදී කාන්තා ශ්‍රම බලකායේ වැඩිම සහභාගීත්වය ගොනුව් පැවතියේ කෘෂිකාර්මික, වන සහ ධීවර අංශයේය. එය 41.6% ක් තරම් ඉහළ අගයක පැවතිණි (Annual Report of the Sri Lanka Labour Force Survey-2000). මේ අනුව අතීතයේ පටන් ශ්‍රී ලාංකික ශ්‍රම හමුදාවේ කාන්තාවන් වැඩිවශයෙන් ඒකරාශි වූ අංශයක් ලෙසින් කෘෂිකාර්මික අංශය හඳුනා ගත හැක. යැපුම් කෘෂිකර්මයට සම්බන්ධ කටයුතු වල යෙදෙන පිරිස නිල ශ්‍රම බලකාය තුළ අදෘෂ්‍යමානව පවතින හෙයින් වී, අතුරුබෝග, කුළුබඩු වගාවන්, ගෙවතු කෘෂිකර්මය, තේ වගාවන් සහ ගව පාලනය වැනි කෘෂි නිෂ්පාදනවල ක්‍රියාකාරිව සහභාගීවන පිරිස කාන්තා ශ්‍රම බලකායෙන් අඩකට වැඩිවිය හැකිය (ගුණවර්ධන, 1995). මෙයට අමතරව වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයන් ලෙස සැලකෙන පිරිසෙන් බොහෝ පිරිසක් කෘෂිකර්මය තුළ ශ්‍රමය යොදවනු ලබයි. 1990 දශකයේ මුල සිට ශ්‍රී ලංකාවේ වැටුප් ලබන කාන්තා ශ්‍රමිකයන් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් ගොස් වර්තමානය වනවිට ආන්තික වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. එනම් 1992 දී 63.4% ක්ද 1998 දී 55.4% ක්ද වූ වැටුප් ලබන කාන්තා ශ්‍රමිකයන් ප්‍රමාණය 2002 දී 60.3% දක්වා වර්ධනය වී ඇත. (Annual Report of the Sri Lanka Labour Force Survey- 2000,Quartely Report of the Sri Lanka Labour Force Survey- 2002 3rd Quarter) එයට සාපේක්ෂව වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන කාන්තාවන් ප්‍රමාණය තියුණු ලෙස වර්ධනය වී ඇත. 1994 දී 14.6% ක්වූ වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයන් වූ කාන්තාවන් ප්‍රමාණය 2000 වසර වනවිට 26.5% දක්වා වර්ධනය විය. 1997 මානව

සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයේ නියුතු කාන්තාවන්ගෙන් 56% ක් වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයන් ලෙස කටයුතු කරනු ලබයි. දකුණු ආසියාවේ අනෙකුත් රටවලද මෙයට සමාන තත්ත්වයක් පිළිබිඹු කරනු ලබයි. එනම් පකිස්ථානය 39%, බංග්ලාදේශය 74%, මාලදිවයින 57% ආදී වශයෙන් කාන්තාවන් වැටුප් නොලබන පවුලේ ශ්‍රමිකයන් ලෙස කටයුතු කරනු ලබයි. ස්වර්ණා ජයවීර (1995) පෙන්වා දෙන අන්දමට 1980 දශකයේ සිදුවූ ව්‍යුහාත්මක ගැළපීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් සුළු ගොවි පවුල්වල කාන්තාවන්ට කෘෂි අංශයේ කුලීකරුවන් ලෙස හෝ පවුලේ වැටුප් නොලබන ශ්‍රමිකයන් ලෙස හෝ කටයුතු කිරීමට සිදුවූ අතර 1990 දශකයේදී මෙය වඩා වේගවත්ව සිදුවිය. ඉහත ක් කරුණු සියලුම සැලකිල්ලට ගැනීමේදී පෙනී යන්නේ සත්‍ය වශයෙන්ම නිල ශ්‍රම බලකා දත්තවලින් පෙන්නුම් කරන ප්‍රමාණයට වඩා කාන්තා ශ්‍රම දායකත්වයක් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය තුළ නියෝජනය වන බවයි.

වී, එළවළු ඇතුළු අනෙකුත් කෘෂිකාර්මික අංශයන් තුළ කාන්තාවන් වැඩි වශයෙන් පැළ සිටුවීම, අස්වනු නෙළීම, ශුද්ධ කිරීම, වියලීම, ධාන්‍ය ගබඩා කිරීම ආදී විවිධාකාරයේ කාර්යයන්හි නියැලෙන අතර වැවිලි කෘෂිකර්මාන්තය පිළිබඳව සළකා බැලුවහොත් තේවතු ආශ්‍රිතව තේ දළු නෙළීමත්, රබර් වතු ආශ්‍රිතව රබර් කිරි කැපීමත් කාන්තාවන්ට වෙන්වූ කාර්යයන් ලෙසින් සළකනු ලබයි. මේ අනුව මාක්ස්වාදී කාන්තාවාදී න්‍යායේ පෙන්නුම් කෙරෙන ආකාරයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව සිදු වූ කාර්යාත්මක විභේදනයක් මේ අනුව දැකිය හැකිය. දේශීය කෘෂිකර්මය තුළ පසු අස්වනු සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ ශ්‍රමික පිරිසෙන් 50% අධික ප්‍රමාණයක් කාන්තාවන් වන අතර වී තැම්බීමේ කාර්යය සම්පූර්ණයෙන්ම පාහේ කාන්තාවන්ගේ කාර්යයක් ලෙස සැළකේ (ගමගේ, 2003). මෙයට අමතරව පිරිමින්ගේ කාර්යයක් ලෙස සැළකෙන බිම් සකස් කිරීමේ කාර්යයන්හිද ඇතැම්විට කාන්තාවෝ නියැලෙති. කෙසේ වුවද ඔවුන් බොහෝ විට සැළකෙන්නේ නිෂ්පාදකයින් ලෙස නොව නිෂ්පාදන සහායකවරුන් ලෙසිනි. එ තුළින් ඔවුන්ගේ නිෂ්පාදනයේ අයිතිය ඔවුන්ට අහිමි වේ.

ශ්‍රී ලංකාවේ මෙන්ම දකුණු ආසියාතික කලාපයේ අනෙකුත් රටවලද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාන්තා දායකත්වය පිළිබඳව පෙන්නුම් කරනුයේ මෙවැනිම වූ තත්ත්වයකි. මෙම කලාපයේ අනෙකුත් රටවල කාන්තා ශ්‍රමය වැඩි වශයෙන්ම යොමුවී ඇත්තේ කෘෂිකාර්මික අංශයටය. බංග්ලාදේශ ගැමි කාන්තාවන්ගෙන් 90% පමණ කෘෂිකර්මය ආශ්‍රිතව සේවා නියුක්ත වේ. ඔවුන් ප්‍රධාන වශයෙන්ම නුපුහුණු, ග්‍රාමීය හා නාගරික කෘෂිකාර්මික සේවාවන් සඳහා යොමුවී ඇත (සිල්වා,1996;7-8). බංග්ලාදේශ කාන්තාවන් කුඹුරෙහි විවිධ කාර්යයන්හි නියුක්තව සිටිනු දක්නට ලැබෙන්නේ කලාතුරකින් වුවත් බීජ ආරක්ෂා කිරීම හා ගබඩා කිරීම, අස්වනු නෙළීමෙන් පසු සහල් සකස් කිරීම, ධාන්‍ය ගබඩා කිරීම, එළවළු සහ පලතුරු වගා කිරීම, සතුන් රකබලා ගැනීම, සත්ව නිෂ්පාදනවල නියැලීම, ආහාර සුරක්ෂිත කරගැනීම ආදී කෘෂිකාර්මික අංශයන්ට සම්බන්ධ විවිධාකාරයේ කටයුතුවල ඔවුන් නියුතු වේ (Dixit,1998;35) කෙසේ වුවද බංග්ලාදේශ පිරිමින් සළකන්නේ කාන්තාව මුදල් ඉපයීමෙහි යෙදුනහොත් ඔවුන් එවා නිරර්ථක දේවල් සඳහා වියදම් කිරීමට පෙළඹීම නිසා පවුලේ ආරවුල් ඇතිවීමෙන් පවුල් බිඳ වැටීමට එය හේතුවක් වන බවයි. එරට කාන්තා ජනගහනයෙන් ශ්‍රම බලකායට ඇතුලත් වන පිරිස අවම

වීමට මෙයද එක් හේතුවක් වී ඇත. කෙසේ වුවද පවුලේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකය සඳහාද විශාල කාර්යභාරයක් ඉටුකරන බංග්ලාදේශ කාන්තාවගේ ශ්‍රම දායකත්වය නිවසේ බිත්ති අතර සැගවුණු දෙයක් බවට පත්ව ඇත.

නේපාලයේ කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වයද වැඩි වශයෙන් කෘෂිකාර්මික අංශය වෙත යොමුවී ඇත. 1993 නේපාල රජයේ සංඛ්‍යා ලේඛන අනුව කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වයෙන් 89.8% ක් යොමුවී ඇත්තේ කෘෂිකාර්මික අංශයටය (ද සිල්වා,1996;8-9). පකිස්ථානයේ කාන්තාවන්ද සත්ත්ව පාලනය ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල වැඩි වශයෙන් නිරතවන නමුත් එය රැකියාවක් ලෙස සළකනු නොලබයි. පකිස්ථානයේ පන්ජාබ්හි කාන්තාවන් පැළ සිටුවන සහ අස්වනු නෙළන කාලය හැර සාමාන්‍යයෙන් දිනකට පැය 14 ක් පමණ වැඩෙහි යෙදේ. තිරිගු අස්වනු නෙළන කාලය එනවිට ඔවුන් සාමාන්‍යයෙන් දිනකට පැය 10 ක් පමණ කුඹුරුවල අස්වනු නෙළීමේ කාර්යයේ නියැලේ. එයට අමතරව එදිනෙදා ගෘහීය කටයුතු ලෙස සතුන් බලාගැනීම, ආහාර පිසීම, දර එකතු කිරීම ආදී බොහෝ කාර්යයන් ඔවුන් අතින් ඉටුවේ (Dixit,1998;29-30).

ඉන්දියාවේ 1991 ජනසංගණනය අනුව සමස්ත ශ්‍රම හමුදාවෙන් 27.2% ක් කාන්තාවන් වන අතර එය එරටෙහි කාන්තා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස සැලකුවහොත් 16.8% ක් තරම් අඩු අගයක පවතී. කෙසේ වුවද මෙම සංඛ්‍යා ලේඛනවලට එරට ගැමි කාන්තාවන් පවුලේ කෘෂිකාර්මික සහ නිෂ්පාදයන්ට කරන ශ්‍රම දායකත්වය ඇතුළත්කර නොමැත. ඉන්දීය ගැමි කාන්තාවන්ගෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ඉඩම් අහිමි කෘෂි කම්කරුවන් වන අතර, 33% ක් කෘෂිකර්මය ආශ්‍රිත ව්‍යාවසායන්හි ස්වයං රැකියාවල නිරත වේ (Dixit, 1998:32).

ඉහත තොරතුරු අනුව ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික කලාපයේ ශ්‍රම බලකායේ කාන්තාවන් වැඩි වශයෙන් කෘෂිකාර්මික අංශය කෙරෙහි යොමුවී ඇති බව පෙනේ. එසේ වුවද ඔවුන් පවුලේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදන ශ්‍රමය පිළිබඳ තක්සේරු කිරීමක් නිල සංඛ්‍යා ලේඛනවලදී සිදුනොවේ.

## වී ගොවිතැන ආශ්‍රිතව කාන්තාවන් මුහුණපාන ගැටළු සහ දුෂ්කරතා.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ කන්තාවන් විවිධ ගැටළුවලට මුහුණපානු ලබයි. මෑත කාලයේ සිට ගොවිපළ කටයුතු යාන්ත්‍රීකරණය වීම නිසා කාන්තාවන්ගේ ශ්‍රමය ගොවිපළ කටයුතු සඳහා යොදවා ගැනීමේ මෙන්ම එම යාන්ත්‍රීකරණයට කාන්තාවන් අනුගත කර ගැනීමේ අඩුවක් පෙන්නුම් කරනු ලබයි. 1985-1989 දක්වා ගොවිපළ යාන්ත්‍රීකරණ මධ්‍යස්ථාන තුළ පුහුණුව ලැබූ කාන්තාවන් ප්‍රතිශතය ඉතාම සීමිත වේ. කාන්තාවන් එම කාලය තුළ පුහුණුව ලැබූ අංශ සහ සංඛ්‍යාව විමසා බැලීමේදී, එ බව පැහැදිලි වේ.

## ගොවිපළ කටයුතු යාන්ත්‍රීකරණය පිළිබඳ කාන්තා පුහුණුවීම්.

| යාන්ත්‍රික පුහුණුව | කාන්තා ප්‍රතිශතය % |
|---|---|
| පැළ සිටුවීමේ යන්ත්‍ර | 7.2% |
| පළිබෝධනාශක ඉසීමේ යන්ත්‍ර | 3.2% |
| වතුර පොම්ප | 2.4% |
| රෝද දෙකේ ට්‍රැක්ටර් | 1.0% |
| රෝද හතරේ ට්‍රැක්ටර් | 3.3% |

**මූලාශ්‍ර** - Woman and Technology - Working paper No:3 CENWOR.

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ බොහොමයක් කටයුතු යාන්ත්‍රීකරණයට ලක්වී ඇත. වී ගොවිතැන ආශ්‍රිතව පැළ සිටුවීම, වල් නෙළීම ආදී කාන්තාවන්ගේ කාර්යයන් ලෙස සැළකෙන කාර්යයන් තවදුරටත් කාන්තාවන් වෙත ඉතිරිව පවතින අතර ගොවිපළ තුළ යාන්ත්‍රීකරණය වූ කටයුතුවල නිරතවීම බොහෝ දුරට පිරිමින් විසින් සිදුකරනු ලබයි. මේ අනුව මාක්ස්වාදී කාන්තාවාදීන් පෙන්වා දෙන අන්දමේ (Engles, 1972) මුලදී පැවති ශ්‍රම විභජනය පසු කාලයකදී ලිංගිකමය වශයෙන් සිදුවූ ශ්‍රම බෙදීමක් බවට පත්වීම තුළින් සෑම සමාජයක්ම ව්‍යුහගත වී ඇති අතරම වර්තමානය වන විට තාක්ෂණය යොදවා ගනිමින් සිදුකරන කාර්යයන් පිරිමින් වෙතත්, පැලසිටුවීම, වල් නෙළීම, අස්වනු නෙළීම, ආහාර සුරක්ෂිතතාව, පසු අස්වනු සකස් කිරීමේ ආදී තවමත් යාන්ත්‍රීකරණය නොවූ බොහෝ කාර්යයන් කාන්තාවන් වෙතත් පැවරී ඇත. ඉදිරියේදී ගොවිපළ කටයුතු තවදුරටත් යාන්ත්‍රීකරණය වීමේ නැඹුරුවක් පවතින අතර මෙම තත්ත්වය තුළ කාන්තා ශ්‍රමයට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පවතින ඉල්ලුම අඩු වී එම අංශයේ කාන්තා ශ්‍රමය අවතැන්වීමේ තර්ජනයකට මුහුණ පා ඇත. ලිබරල්, කාන්තාවාදී සාකච්ඡාවන්හිදී (Tong,1992,17-19) අවධාරණය කරනු ලබන පිරිමින් භුක්තිවිඳිනු ලබන සෑම වරප්‍රසාදයක්ම, ඉඩ ප්‍රස්ථාවක්ම කාන්තාවන්ට හිමිවිය යුතුය යන අදහස ඔස්සේ මෙම තත්ත්වය විමසීමේදී පැහැදිලි වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙම තත්ත්වය උද්ගත වී ඇති බවයි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වැඩෙහි යෙදෙන කාන්තාවන් මුහුණදෙන ගැටළු සම්බන්ධව අවධානය යොමුකිරීමේදී මතුවන තවත් අංශයකි ඔවුන් කාර්යයන්හි නිරතවන වේලාවන් සම්බන්ධව පැන නගින ගැටළු. මේ සම්බන්ධව සිදුකරන ලද අධ්‍යයනයන්ගෙන් පෙන්වා දී ඇති අන්දමට ගොවිපළ කටයුතුවලට අමතරව ගෘහස්ත කටයුතු කාන්තාවන්ට අයත් බවට තිබෙන දැඩි පිළිගැනීම නිසා කාන්තාවන් හා පුරුෂයින් අතර ශ්‍රමය බෙදීයාම පිළිබඳ දැඩි අසමානතකම් පවතී

(සිරිසේන,1986,ගුණවර්ධන 1985,කුමුදුනී; 1995). මෙම තත්ත්වය තුළ කාන්තාවන් වෙත වැඩි කාර්යභාරයක් සහ වගකීමක් පැවරෙන අතර ඒ සඳහා තම කාලයෙන් වැඩි වේලාවක් කැපකිරීමටද සිදුවේ. මහවැලි ජනාවාසවල කාන්තාවන් මේ ආකාරයට දිගටම පැය 12 ක් පමණ.කාලයක් වී වගාව,ගෙවතු වගාව,සත්ත්ව පාලනය සහ ගෘහ කටයුතු සඳහා කැපකරන බව අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත (ජයවීර.1985;6). මාක්ස්වාදී කාන්තාවාදී න්‍යායේදී මෙම තත්ත්වය පැහැදිලි කරනු ලබන අතර මුල් අවස්ථාවල සිටම පිරිමින්ගේ කාර්යය ලෙස කුමන හෝ නිෂ්පාදන ක්‍රියාවලියක් තුළින් ගෙදර දොර අවශ්‍යතා සම්පූර්ණ කිරීම සැලකූ අතර කාන්තාවන්ගේ කාර්යයන් ලෙස සැලකුනේ දරුවන් රැකබලා ගනිමින් ගෘහාශ්‍රිත කටයුතු ඉටු කිරීමය. මෙහිදී කාන්තාවගේ කාර්යය කොටස බොහෝ දුරට පිරිමියාගේ ආර්ථික ක්‍රමයට යහපත් බලපෑමක් වශයෙන් පවතී (Engles, 1972). එසේ වුවත් එහිදී කාන්තාව නිෂ්පාදන කටයුතු සඳහා සිදු කරන දායකත්වය සැලකිල්ලට භාජනය නොකරන අතරම ඇය සැලකෙන්නේ යැපෙන්නියක ලෙසිනි.

එමෙන්ම කෘෂිකර්මය තුළ කාන්තා ශ්‍රමය බහුල වශයෙන් යෙදවුනත් පවුල් ගොවිතැන පිළිබඳ පවතින සාමූහික න්‍යාය පදනම් කර ගනිමින් කුලී ඉපැයුම් හැර කාන්තාවන්ගේ ඉපැයුම් පවුලේ ආදායමේ කොටසක් ලෙස සැලකේ. මේ නිසා ඔවුන් උපයන සම්පත්වල පාලනය ඔවුන්ට අහිමි වී යාම සිදු වේ (ජයවීර.1995;182). මෙය කෘෂිකාර්මික කේෂත්‍රය තුළ කාන්තාවන් මුහුණදෙන එක් ගැටළුවක් වේ. එනම් ඔවුන් උපයන ආදායම්වල පාලනය කාන්තාවන්ට අහිමිවීම තුළ කාන්තාව තවදුරටත් පිරිමියා උපයන දෙයින් යැපෙන්නියක ලෙසින් සැලකෙන අතරම එවැනි කාන්තාවගේ ආර්ථික සහ සමාජමය බලාත්මකභාවය කෙරෙහිද මෙය අහිතකර අන්දමින් බලපෑම් කරනු ලබයි.

කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ කාන්තාව වැදගත් දායකත්වයක් සිදු කළත් කෘෂිකාර්මික ඉඩම් පැවරීමේදී චාරිත්‍රමය නීතිය මෙන්ම සම්ප්‍රදායික සමාජ පිළිගැනීම්වලදීද පිරිමින්ට වැඩි වාසි සහගත තත්ත්වයක් හිමිවේ (ගමගේ,2003;04). මෙම තත්ත්වය නිෂ්පාදන සම්පත්වල සමාන හිමිකාරිත්වයක් සඳහා කාන්තාවන්ට බාධා පමුණුවනු ලබයි. මෙයට අමතරව 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත සහ පසුකාලයක සිදු කරන ලද සංශෝධනද අනුව මහවැලි ඉඩම් පිරිනැමීමේදී මුල් අවස්ථාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් අහිමිවිණ. මෙහිදී මුල් ගමෙහි ඉඩම් අයිතිය කාන්තාව සතුවුවත් මහවැලි ජනාවාස ඉඩම් හිමිකම පිරිමින් වෙත පැවරිණ. මේ අනුව මුල්ගම්වල ඉඩම් හිමිකම තිබූ කාන්තාවන්ට මහවැලි ජනාවාසවලදී ඉඩම් හිමි නොවිණ. කෙසේවුවද මහවැලි සංවර්ධන අධිකාරිය විසින් පසුව ඉඩම් බෙදාදීමේදී මුල් ගම්වල ඉඩම් හිමිකරුගේ අයිතිය සළකා බලා ඉඩම් හිමිකම තීරණය කිරීම නිසා එම තත්ත්වය මහවැලි කලාපය තුළ පසුව බෙදූ ඉඩම් සඳහා මගහැරී ඇත (ජයවීර,1985;5,1995,182).

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් ලෙසින් කාන්තාවන් මුහුණ දෙනු ලබන තවත් අසමාන සැළකිල්ලක් වනුයේ සමාන ශ්‍රමය සඳහා අසමාන වැටුප් ගෙවීමයි. තේ වැවිලි කර්මාන්තය ආශ්‍රිතව මුල් කාලයේ පටන් පැවති මෙම තත්ත්වය හේතුකර ගනිමින් 1980 දශකය මැද භාගය දක්වා වැටුප් ගෙවීම සිදුවූයේ අසමාන ආකාරයකිනි. එය පිළිවෙළින් පිරිමින්, කාන්තාවන් සහ ළමුන් සඳහා 5:4:3 අනුපාතයට විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ

අනෙකුත් අංශවලද මෙම තත්ත්වය දැකිය හැකි විය. වී වගාව ආශ්‍රිතව කරන ලද අධ්‍යයනයන් කිහිපයකදී මෙම තත්ත්වය හදුනාගෙන ඇත (රණතුංග සහ අබේසේකර (1977), සේපාල සහ අනෙකුත් අය (1988), සේනානායක සහ විජේතුංග (1987)). සේනානායක සහ විජේතුංග (1987) පෙන්වා දෙන අන්දමට 1978 සිට 1983/84 දක්වා සමාන කාර්යයන් සදහා කාන්තා සහ පිරිමි ශ්‍රමිකයන්ට ගෙවනු ලබන වැටුප් පහත සදහන් පරිදි වේ.

## වී වගාව ආශ්‍රිත දෛනික වැටුප් ගෙවීම්.

| කාර්යය | ස්ත්‍රී/පුරුෂ භාවය | 1978 (අ) | 1979 (ආ) | 1982 (ඇ) | 1983 (ඇ) | 1983/84 (ඇ) |
|---|---|---|---|---|---|---|
| පැළ සිටුවීම | පුරුෂ | - | 12.0 | 27.3 | 34.4 | - |
| | ස්ත්‍රී | - | 10.0 | 21.9 | 25.7 | - |
| වල් නෙළීම | පුරුෂ | 7.0 | 10.0 | - | - | 30.9 |
| | ස්ත්‍රී | 7.0 | 9.3 | 21.0 | 25.1 | 23.5 |
| අස්වනු නෙළීම | පුරුෂ | | | | | |
| | ස්ත්‍රී | 8.0 | 13.3 | 29.4 | 34.9 | 34.0 |
| | | - | 11.4 | 22.8 | 28.4 | 29.0 |

(අ) - බොලාන ගම, හම්බන්තොට දිස්ත්‍රික්කය.

(ආ) - හම්බන්තොට දිස්ත්‍රික්කය.

(ඇ) - මුළු දිවයිනම.

(ඈ) - කිරිදිඔය වාරිමාර්ග ක්‍රමයේ වම් ඉවුර (දෙබර වැව, තිස්ස වැව, යෝධ වැව) සහ දකුණු ඉවුර (පන්නේගම, වීරවිල, බිංගිරිය).

**මූලාශ්‍ර** - Senanayake S.M.P. & Wijetunge, L.D.I. (1987) ARTI

මෙම අදහස තවත් අධ්‍යයනයන් කිහිපයකින් තහවුරු කර ඇත. එනම් 1966 සිට 1980 දක්වා කාන්තා සහ පිරිමි ශ්‍රමිකයන් අතර වැටුප් විෂමතා පහත සදහන් පරිදි විය.

| ස්ත්‍රී පුරුෂ භාවය | 1966 කෑම රහිතව (දිනකට රු.) | 1971 කෑම සහිතව (දිනකට රු.) | 1980 (දිනකට රු.) |
|---|---|---|---|
| පිරිමි | 3.0 | 4.50 | 20.00 |
| කාන්තාවන් | 2.50 | 3.00 | 15.00 |

**මූලාශ්‍ර** - Sepala, A.C.K., Gamage, D & Senakarachchi, R. G. (1988) ARTI

මේ ආකාරයට වී වගාව සඳහා යොදා ගැනෙන කුලී ශ්‍රමය සඳහා දෛනික වැටුප් ගෙවීමේදී ස්ත්‍රී පුරුෂ භාවය අනුව විෂමතාවක් පවතින අතර එය ප්‍රදේශ අනුවද තවදුරටත් වෙනස් වේ.

## වී වගාව ආශ්‍රිතව කුළී ශ්‍රමයට ගෙවන දෛනික වැටුප් ප්‍රමාණ- ප්‍රදේශ අනුව (1977)

| ප්‍රදේශය | පිරිමි (දිනකට/ රු) | ගැහැණු (දිනකට රු) | ළමුන් (දිනකට/රු) |
|---|---|---|---|
| පොළොන්නරුව | 10.00 | 8.00 | 7.50 |
| හම්බන්තොට | 10.00 | 8.00 | 7.00 |
| කෑගල්ල - මහනුවර | 9.00 | 7.00 | 4.00 |
| කොළඹ | 6.50 | 5.00 | 4.00 |

**මූලාශ්‍රය - රණතුංග ඒ.එස්. සහ අබේසේකර ඩබ්.ඒ.ටී. (1977). ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**

මෙම දත්ත අනුව වී වගාව අඩුවෙන් සිදු කෙරෙන දිස්ත්‍රික්කයක් වන කොළඹ ප්‍රදේශයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාන්තා ශ්‍රමිකයින්ට ලැබෙන දෛනික වැටුප පොළොන්නරුව සහ හම්බන්තොට වැනි වී ගොවිතැන බහුලව සිදු කෙරෙන ප්‍රදේශවල කාන්තා ශ්‍රමිකයන්ට ලැබෙන දෛනික වැටුපට වඩා සැලකිය යුතු මට්ටමේ අඩු වැටුපකි. වී ගොවිතැන බහුල වශයෙන් සිදුකෙරෙන ප්‍රදේශවල කෘෂිකාර්මික අංශයේ ශ්‍රමයට පවතින ඉල්ලුම ඉහළ මට්ටමක පැවතීම නිසා එම ප්‍රදේශවල කෘෂිකාර්මික ශ්‍රමයට (ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයටම) ගෙවන දෛනික වැටුප් ප්‍රමාණය කෘෂිකාර්මික කටයුතු බහුලව සිදු නොකෙරෙන ප්‍රදේශවල එම අංශයේ දෛනික වැටුපට වඩා ඉහළ මට්ටමක පවතින බව පෙනේ.

**කෘෂිකර්මකරුවන් සඳහා දෛනික වැටුප් - 1999/2000**

| දිස්ත්‍රික්කය | පිරිමි ශ්‍රමිකයන්ට (දිනකට /රු.) | කාන්තා ශ්‍රමිකයන්ට (දිනකට /රු.) |
|---|---|---|
| ගම්පහ | 175.00 | 150.00 |
| අනුරාධපුර | 175.00 | 150.00 |
| මාතලේ | 175.00 | 150.00 |
| බදුල්ල | 175.00 | 150.00 |
| කෑගල්ල | 175.00 | 150.00 |
| නුවරඑළිය | 175.00 | 125.00 |
| ගාල්ල | 200.00 | 175.00 |

**මූලාශ්‍රය** - Crop Enterprise Budgets , Dept. of Agriculture (2000).

ඉහත වගුවෙන් පෙන්නුම් කරන ආකාරයට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රටේ සියළුම ප්‍රදේශවල පාහේ කාන්තාවන් සහ පිරිමින්ට වැටුප් ගෙවීමේදී සැලකිය යුතු මට්ටමේ අසමානතාවක් පවතී.

සේනානායක සහ විජේතුංග (1987) පෙන්වා දෙන අන්දමට වල් නෙළීම සහ පැල සිටුවීම වැනි කාර්යයන්වලදී කාන්තා ශ්‍රමය වැඩි කාර්යක්ෂමතාවකින් යුතුවේ. එසේ වුවත් ඔවුන්ට ගෙවන වැටුප පිරිමින්ට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. මෙසේ සමාන කාර්යයකදී කාන්තා ශ්‍රමය වැඩි කාර්යක්ෂමතාවක් පෙන්නුම් කළත් පිරිමි ශ්‍රමිකයන්ට සාපේක්ෂව කාන්තාවන්ට අඩු වැටුප් ගෙවීම අධ්‍යයනයට ලක්කළ යුතු කරුණක් ලෙයින් පවතී.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාන්තාවන්ට මුහුණදීමට සිදුවන මෙවැනි තත්ත්වයන්ට අමතරව ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් ලෙයින් කාන්තාවන් විවිධ අසමාන සැලකිලිවලට, දුෂ්කරතාවන්ට මෙන්ම අයිතිවාසිකම් කඩවීම්වලටද මුහුණදෙනු ලබයි. "ජාති, වංශ, වර්ණ, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව,ආගම, දේශපාලනය ආදී කවර භේදයක් හෝ සමාජ ජාතිය, දේපල, උපත අදී කවර තත්ත්වයක විශේෂයක් හෝ නැතුව මෙම ප්‍රකාශනයේ සඳහන් සියළු හිමිකම් සහ ස්වාධීනත්වය සෑම පුද්ගලයෙකුටම උරුම වන්නේය". යන මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ දෙවැනි වගන්තියට අනුව කාන්තාවන්ටද පුරුෂයන්ට හා සමානව අධ්‍යාපනයේ, රැකියාවක යෙදීමේ, සමාන වැටුප් ලැබීමේ, නියෝජනයේ නිදහස ඇතුළු සියළු අයිතිවාසිකම් හිමිවේ (මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය). කෙසේ වුවද ප්‍රායෝගික වශයෙන් බොහෝ රටවල කාන්තාව දෙවැනි ගණයේ පුරවැසියෙකුගේ තත්ත්වයෙහිලා සලකන බවත් ඒ ඔස්සේ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීමකට ලක්වන බවද පෙනේ. එම අයිතිවාසිකම් උල්ලංඝනයවීම කිහිප ආකාරයකට සිදුවේ. ජීවත්වීමේ අයිතිය, ගෘහාශ්‍රිත ප්‍රචණ්ඩත්වය, ගණිකා වෘත්තියෙහි යෙදවීම, ආදායම් බෙදීයාමේ විෂමතාව, සේවා වියුක්තිය සහ සේවා නියුක්තිය ආදී විවිධාකාර අංශ තුළ එය ක්‍රියාත්මක වේ.

## ජීවත්වීමේ අයිතිය.

ඉන්දියාවේ සති පූජාව නිසාත්, ජෝර්දානය, පකිස්ථානය වැනි රටවල පවුලේ ගෞරවය රැක ගැනීම සඳහා ස්ත්‍රීන් ඝාතනය කිරීමේ සිරිත (honour killing) නිසාත්, බංගලාදේශය, ඉන්දියාව වැනි රටවල දායාද ප්‍රශ්න මත සිදුවන මරණ නිසාත් කාන්තාවන්ගේ ජීවිතය පිළිබඳ නිදහස අහිමිවීම් සිදුවේ.

1999 වසර තුළ පාකිස්ථානයේ ගරුත්වය උදෙසා සිදුකළ කාන්තා ඝාතන 1000 කට අධික වේ. ජෝර්දානයේ 1997 දී වාර්තාවූ අන්දමට එවැනි අවස්ථා 20කි (UNDP, 2002; 36). ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙවැනි සිදුවීම්වලට මුහුණදීමට කාන්තාවන්ට සිදුවේ.

## ස්ත්‍රී දූෂණ

දූෂණය ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට බලපාන ප්‍රධාන සාධකයකි යුද්ධමය වාතාවරණයක් සහිත රුවණ්ඩා, යුගෝස්ලාවියා වැනි රටවල මෙන්ම එසේ නොවන රටවලද මේ අන්දමින් කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදුවේ. කෙසේවුවද අනිකුත් රටවල් සමග සැසඳීමේදී ඇමරිකා එක්සත් ජනපදය තුළ වාර්තා වන ස්ත්‍රී දූෂණ ප්‍රමාණය ඉහළ අගයක් ගනී. Rodney Strark පෙන්වාදෙන අන්දමට සෑම වසරක් තුලම ඇමරිකානු කාන්තාවන් ලක්ෂයකට ආසන්න පිරිසක් ස්ත්‍රී දූෂණවලට ගොදුරු වේ (සරත්චන්ද්‍ර, ඩබ්.එ. 2000;25).

**වාර්තාගත ස්ත්‍රී දූෂණ සිද්ධීන් අවු 15 වැඩි කාන්තාවන් - 1994 වර්ෂය**

| රට | කාන්තාවන් ලක්ෂයකින් දූෂණයට ලක්වූ ප්‍රමාණය |
|---|---|
| එස්තෝනියා | 463.6 |
| කැනඩාව | 267.3 |
| බහමා | 220.5 |
| ඕස්ට්‍රේලියා | 199.1 |
| නිකරගුවා | 109.7 |
| ස්විඩන් | 49.9 |
| කොරියානු සමූහාණ්ඩුව | 36.2 |
| රුසියාව | 22.1 |
| මලයාසියාව | 15.5 |
| සිංගප්පූරුව | 6.4 |
| ඉන්දියාව | 4.6 |
| මාලදිවයින් | 2.9 |
| ඉන්දුනීසියා | 2.6 |
| ක්වේට් | 1.8 |

**මූලාශ්‍රය** - Human Development Report 2000

ඉහත දත්ත අනුව වාර්තාගත ස්ත්‍රී දූෂණ ප්‍රමාණය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල ඉහළ අගයක් පෙන්නුම් කරයි. 1997 දී ශ්‍රී ලංකාවේ වාර්තාගත ස්ත්‍රී දූෂණ ප්‍රමාණය 668 කි (සරත්චන්ද්‍ර,2000;27). බොහෝවිට සංවර්ධනය වෙමින් පවතින රටවල වාර්තාවන ස්ත්‍රී දූෂණ ප්‍රමාණයට වඩා සත්‍ය ප්‍රමාණය ඉහළ අගයක් ගැනීමේ ඉඩකඩ ඇත. මෙම රටවල එවැනි සිදුවීම් ලැජ්ජාව නිසා හෝ නුගත්කම නිසා වාර්තාගත වීමේ ප්‍රවණතාව අඩු මට්ටමක පැවතීමට හැකියාව ඇත. පිරිමියා කාන්තාවට වඩා ශක්තිමත් හා බලවත්බව විශ්වාස කිරීමත්, පුරුෂයන් මුල්කරගනිමින් පවතින සාරධර්ම හා ආකල්ප දිගින් දිගට වර්ධනය වීමත් ස්ත්‍රී දූෂණ වර්ධනය වීමට එක් හේතුවක් ලෙස ඇතැමුන් පෙන්වා දෙනු ලබයි. එයට අමතරව ස්ත්‍රිය ලිංගික කාර්යයන් සඳහාම නිර්මාණය වූ කොටසක් ලෙසත් ඔවුන් ලිංගිකත්වයේ සංකේතයක් ලෙසත් ඇතැම් පිරිමින් විසින් සැලකීම තුළ පිළිබිඹුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහසත් මෙයට බලපා ඇති බව පෙනේ.

## ගණිකා වෘත්තිය

කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වන තවත් අංශයක් ලෙසින් කාන්තාවන් ගණිකා වෘත්තියේ යෙදවීම සහ එසේ යෙදවීම සඳහා විකිණීම පෙන්වා දිය හැකිය . සෑම වසරකම ගණිකා වෘත්තියේ යෙදවීම සඳහා ලොව පුරා අවුරුදු දහඅටට (18) අඩු කාන්තාවන් සහ ළමුන් දශ ලක්ෂ 1.2 ක් විකිණීම සිදුවේ. මෙසේ විකිණීමට අමතරව නේපාලයේ "ඩෙයුක් කුලයේ" කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් ස්වකීය පියා හෝ සහෝදරයෙකු විසින් ඔවුන්ගේ පෞද්ගලික අභිමානාර්ථ සලසා ගනුවස් පන්සලේ අධිපති දෙවියාට පූජා කිරීම හේතුවෙන් අවසාන වශයෙන් ගණිකා වෘත්තියට යොමුවීම සිදුවේ. මෙසේ වීමට හේතු සාධක වන්නේ එම අන්දමට පූජා කළ ස්ත්‍රියකට විවාහ වීම හෝ රකියාවක නිරත වීමේ අයිතිය ඩෙයුක් කුලයේ චාරිත්‍රවලට අනුව හිමි නොවන හෙයිනි. බංගලාදේශයද බාල වයස්කාර ගැහැණු ළමුන් ඔවුන්ගේ කැමැත්ත නොවිමසාම විවාහ කර දීම හෝ ගණිකා වෘත්තියේ යෙදවීම සිදු කරයි (ගුණසේකර, එස්, 2002, 175). මේ අන්දමට කාන්තාව ගණිකා වෘත්තියේ යෙදවීම් සහ ඒ සඳහා විකිණීම නිසා කාන්තාව ලිංගික ශ්‍රම සූරාකෑමකට ලක් කරනු ලබයි.

ඉහත සඳහන් අන්දමට ගරුත්වය උදෙසා කාන්තාවන් ඝාතනය කිරීම, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, ගණිකා වෘත්තියේ යෙදවීම සහ ඒ සඳහා විකිණීම ආදී කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන විවිධ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය පසුබිම සමාජය විසින් නිර්මාණය කරනු ලැබූ බල ධුරාවලිය (Power Hierachy) තුළින් ලබාදේ. නැතහොත් මෙම බල ධුරාවලිය තුළ ඉහළින් සිටින පුරුෂ පක්ෂය විසින් බල ධුරාවලියේ පහළ මට්ටමේ සිටින ස්ත්‍රීන් වෙත තම බලය පතුරුවා හැරීම තුළින් ඔවුන් යටත් කර ගැනීමටත්, මර්දනය කිරීමටත් උත්සාහ ගනී. මෙම ක්‍රියාවලිය තුළ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනයවීම සෘජුවම සිදුවේ.

## සමාන සේවා සඳහා අසමාන වැටුප් ගෙවීම

සමාන සේවා සඳහා අසමාන වැටුප් ගෙවීම මඟින් ඇතැම් රටවල් කාන්තාව දෙවැනි ගණයේ පුරවැසියෙකුගේ තත්ත්වයෙහිලා සළකන අතර ශ්‍රම සූරාකෑමකට මෙන්ම අසමාන සැළකිල්ලකටද භාජනය කිරීමක් සිදු කරයි. මෙයට නිදසුනක් ලෙස කොරියානු සමූහාණ්ඩුව දැක්විය හැකිය. එහි කාන්තාවන් ලබන වැටුප පිරිමින් ලබන වැටුපෙන් 3/5 කි. මෙම ක්‍රියා මාර්ගය තුළින් සමාන සේවයක් සඳහා සමාන වැටුප් ලැබීමේ අයිතිය කාන්තාවන්ට අහිමි කරනු ලබයි. ශ්‍රී ලංකාවේ වතු වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතවද මුල් කාලීනව මෙවැනි තත්ත්වයක් දැකිය හැකිවිය. මුල් අවධියේදී වතුවල වැඩ කළ ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ වේතන පවුලේ ප්‍රධානියාට ගෙවනු ලැබූ "පවුල් වේතනය" වශයෙන් ගණින් බැලිණි. ඉන්පසුව ස්ත්‍රීන්ට වෙනම වේතන ගෙවන්නට පටන්ගත් විට වේතන වෙනස්කම් සහිත විය. විසිවන සියවසේ වැඩි කාලයක් තුළ පුරුෂයන්, ස්ත්‍රීන් සහ ළමයින් සඳහා ගෙවන ලද වේතන අනුපාතය පිළිවෙලින් 5:4:3 වීමෙන් ඉහත කරුණු සනාථ වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස ඉස්මතුවීම නිසා මේ අකාරයට සමාන කාර්යයන් සඳහා අසමාන වැටුප් ගෙවීම සිදුවී ඇත. කෙසේ නමුත් වර්තමානය වනවිට තේ වැවිලි ක්ෂේත්‍රය තුළ සමාන කාර්යයන් සඳහා ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට සමාන වැටුප් ගෙවනු ලැබුවත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අනියම් කම්කරුවන් සඳහා කරනු ලබන ගෙවීම් ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් වේ.

## වැඩිහිටි සාක්ෂරතාව

වැඩිහිටි සාක්ෂරතාව පිළිබඳ සාධකය පිළිබඳ සළකා බලන විට පෙනී යන්නේ බොහොමයක් රටවල පුරුෂයන්ට සාපේක්ෂව කාන්තාවන්ගේ සාක්ෂරතාව අඩු මට්ටමක පවතින බවයි. එසේවුවද කැනඩාව, නෝර්වේ, ස්වීඩන්, එක්සත් රාජධානිය, ප්‍රංශය, ජර්මනිය, ලැට්වියා, බ්‍රසීලය, මාලදිවයින් වැනි රටවල එය සම අගයකින් පවතී. ලොව පුරා අවුරුදු 15 ට වැඩි පුද්ගලයන්ගේ සාක්ෂරතාව ස්ත්‍රී පුරුෂ බව අනුව විමසුවහොත් කාන්තාවන්ගේ ප්‍රතිශතය 73.1% ද පිරිමින්ගේ ප්‍රතිශතය 84.6% ද වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම අගය කාන්තාවන් සඳහා 64.5% ද පුරුෂයන් සඳහා 80.3% ද වේ. අරාබි රටවල මෙය කාන්තාවන් සඳහා 47.3% ද පුරුෂයන් සඳහා 71.5% ද ලතින් ඇමරිකාව හා කැරිබියානු දූපත්වල කාන්තාවන් සඳහා 86.7% හා පුරුෂයන් සඳහා 88.7% ද වේ (UNDP,2000 ;164).

අග්නිදිග ආසියාව සහ පැසිෆික් කලාපයේ කාන්තා සාක්ෂරතාව 85.0% ද පුරුෂයන්ගේ සාක්ෂරතා මට්ටම 92.4% ද වේ. නැගෙනහිර ආසියාවේ පිළිවෙලින් 75.5% සහ 91.1% ද දකුණු ආසියාවේ 42.3% සහ 65.7%කි. උප සහරා කලාපයේ 51.6% සහ 68.0% ද වශයෙන් කාන්තා සහ පිරිමි සාක්ෂරතා මට්ටම දැක්වේ. මේ සියළුම රටවල පුරුෂයින්ගේ සාක්ෂරතා මට්ටම කාන්තාවන්ගේ සාක්ෂරතා මට්ටමට වඩා ඉහළ අගයක පවතී. එසේ වුවත් බටහිර යුරෝපයේ හා පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල කාන්තා පුරුෂ සාක්ෂරතා හැකියාව බොහෝ දුරට සමාන මට්ටමක පවතී. එනම් එය පිළිවෙලින් 98.2% සහ 99.1% අගයක් පෙන්නුම් කරයි. දකුණු ආසියාතික කලාපයේ රටවල වැඩිහිටි ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සාක්ෂරතා මට්ටම

විමසීමේදී මාලදිවයින හැරුණු කොට ශ්‍රී ලංකාව අනිත් රටවලට වඩා කාන්තා සහ පිරිමි සාක්ෂරතා මට්ටමේ අඩු වෙනසක් පෙන්නුම් කරනු ලබයි.

දකුණු ආසියාතික කලාපයේ වැඩිහිටි සාක්ෂරතාව
- ස්ත්‍රී පුරුෂ භාවය අනුව
(අවු 15 හෝ එයට වැඩි අයගේ ප්‍රතිශතයක් ලෙස 2000 වර්ෂය)

| රට | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 89.0 | 94.4 |
| ඉන්දියාව | 45.4 | 68.4 |
| පකිස්ථානය | 27.2 | 57.5 |
| බංග්ලාදේශය | 29.9 | 52.3 |
| නේපාලය | 24.0 | 59.6 |
| මාලදිවයින | 96.8 | 96.6 |
| භූතානය | දත්ත නොමැත | දත්ත නොමැත |

මූලාශ්‍රය - Human Development Report-2002.

මේ අන්දමට සාක්ෂරතා මට්ටම අනින් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර විෂමතාවක් ඇතිවීමට එක් සාධකයක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යි. විශේෂයෙන් සංවර්ධනය වන රටවල පවුලේ ආර්ථික ප්‍රශ්න මත ගැහැණු දරුවාගේ අධ්‍යාපනය බොහෝ විට කඩාකප්පල් වේ. ඇතැම් රටවල කාන්තාව අධ්‍යාපනය ලැබීම අත්‍යවශ්‍ය නොවන දෙයක් ලෙස සලකන අතර ඒ තුළින් අධ්‍යාපන අවස්ථා අහිමි වේ. සංවර්ධනය වෙමින් පවතින, කෘෂිකාර්මික රටවල කාන්තාව බොහෝවිට වැටුප් නොලබන සේවකයින් ලෙස තම පවුලේ කෘෂිකාර්මික කටයුතු සඳහා ශ්‍රමය කැප කරන අතර, මෙවැනි අවස්ථාවල ගෘහීය කටයුතුවල යෙදීම සඳහා පවුලේ වැඩිමහල ගැහැණු ළමුන් අධ්‍යාපනයෙන් බැහැරවනු දැකිය හැකිය. එමෙන්ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව මෙවැනි අවස්ථාවල ළමුන් කෘෂිකාර්මික කටයුතු සඳහා අධ්‍යාපන කටයුතුවලින් බැහැරවීමද දැකිය හැකිය. මෙහිදී පොදුවේ ළමුන්ගේ අධ්‍යාපනය සඳහා වූ අයිතිය පැහැර ගැනීමක් / පැහැර හැරීමක් සිදුවේ.

## ආදායම් බෙදියාමේ විෂමතාව

ලොව පුරා ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර ආදායම් බෙදීයාමේ විෂමතාවද එක්තරා දුරකට කාන්තා අයිතිවාසිකම් කෙරෙහි බලපානු ලබයි. කාන්තාව පිරිමියාට වඩා අඩු මට්ටමේ ආදායමක් ලබන විට ඔවුන්ගේ ක්‍රය ශක්තියද පිරිමියාට වඩා අඩු මට්ටමක පවතී. ක්‍රය ශක්තිය අඩු වීම සමඟ පෝෂණ සහ සෞඛ්‍ය තත්ත්වයේ දුර්වලතාවන් ඇතිවීමත් එ තුළින් ශාරීරික සහ මානසික වශයෙන් දුර්වලවීමත් නැවත වතාවක් කාන්තාව දෙවැනි ගණයේ සාමාජිකයෙකුගේ තත්ත්වයට පත්වීමත් මේ මඟින් සිදුවේ. ලොව විවිධ කලාපවල එවායේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එක පුද්ගල ආදායම කාන්තාවන් හා පිරිමින් අතර බෙදීයාම පිළිබඳ තත්ත්වය සළකා බලන විට මෙම විෂමතාව පැහැදිලි වේ.

### ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර්

| කලාපය | කාන්තා | පිරිමි |
|---|---|---|
| අරාබි රාජ්‍යයන් | 1837 | 6341 |
| නැගෙනහිර ආසියාව | 2788 | 4299 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියානු දූපත් | 3640 | 9424 |
| දකුණු ආසියාව | 1147 | 3021 |
| අග්නිදිග ආසියාව සහ පැසිපික් | 2316 | 4154 |
| උප සහරා | 4807 | 7726 |
| බටහිර යුරෝපය හා CIS | 14165 | 26743 |
| සියළු සංවර්ධන වන රටවල් | 2169 | 4334 |

මූලාශ්‍රය - Human Development Report 2000

මෙම සංඛ්‍යා දත්ත අනුව පැහැදිලි වන්නේ ආදායම් බෙදීයාම පිළිබඳ තත්ත්වය විෂම වන බවයි. බොහෝ ප්‍රදේශවල කාන්තාව ලබන එක පුද්ගල ආදායම මෙන් දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයක් පිරිමින් විසින් හිමිකර ගනී. සම අධ්‍යාපන අවස්ථා අහිමිවීම, දේපල හිමිකම පිළිබඳ කාන්තාවට පවතින අයිතිය සීමාවීම, රකියා පිළිබඳ පවතින අසමානතාවද වැටුප් ගෙවීමේ අසමානතාවද ආදායම් බෙදියාම පිළිබඳ මෙම ගැටළුවට බෙහෙවින් හේතු සාධක වේ.

## සේවා වියුක්තිය සහ සේවා නියුක්තිය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තා සේවා වියුක්තිය පිළිබඳ ගැටළුවද වැදගත් ස්ථානයක් හිමිකර ගනී. කාන්තා සේවා වියුක්තිය පිළිබඳව සළකන විට 1998 වන විට කැනඩාවේ 8.2% ද, ඇ.එ. ජනපදයේ 4.7% ද, නොර්වේ 3.2% ද, එක්සත් රාජධානියේ 5.3% ද, කොරියානු සමුහාණ්ඩුවේ 5.8% ක්ද, වේ. මෙම රටවල පුරුෂයින්ගේ සේවා වියුක්ති තත්ත්වයෙ පිළිබඳව

සැලකුවහොත් පිළිවෙලින් 8.6%, 4.5%, 3.3%, 6.9%, 7.9% වශයෙන් පවතී. මෙම රටවල් අතුරින් පුරුෂ සේවා වියුක්තියට සාපේක්ෂව කාන්තා සේවා වියුක්තිය වැඩි රටක් ලෙස පෙන්නුම් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදය පමණි. එසේවුවද බෙල්ජියම, නෙදර්ලන්තය, පින්ලන්තය, ස්විස්ටර්ලන්තය, ප්‍රංශය, ඩෙන්මාර්ක්, ඉතාලිය, ස්පාඤ්ඤය වැනි රටවල කාන්තා සේවා වියුක්තිය පුරුෂ සේවා වියුක්තියට වඩා ඉහළ තැනක් ගනු ලබයි (UNDP, 2000:259-262). ශ්‍රී ලංකාවේ තත්ත්වයද මෙයට සමාන වේ. 1999 වසරේදී ශ්‍රී ලංකාවේ පුරුෂ සේවා වියුක්තිය 6.2% වන විට කාන්තා සේවා වියුක්තිය 11.5% කි (Central Bank of Sri Lanka 2002). මෙහිදී නාගරික කාන්තා සේවා වියුක්තිය ග්‍රාමීය කාන්තා සේවා වියුක්තියට වඩා ඉහළ අගයක් 1990 දශකයේ අවසන් භාගය දක්වා පෙන්නුම් කළත් 2001 වසර වන විට ආන්තික වශයෙන් ග්‍රාමීය කාන්තා සේවා වියුක්තිය නාගරික කාන්තා සේවා වියුක්තියට වඩා වැඩි බවක් පෙන්නුම් කරනු ලබයි (Central Bank of Sri Lanka 2002). මේ අනුව සේවා වියුක්තිය තුළ ග්‍රාමීය කාන්තාව වඩාත් පීඩනයකට පත්වන බව පෙන්නුම් කරයි.

## වැටුප් නොලබන ශ්‍රමිකයින් ලෙස කාන්තාව -

සූක්ෂම අධ්‍යයනයන්ගෙන් සපයාගත් තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ කාන්තාව සාමාන්‍යයෙන් දැනට පැය 14 පමණ ද, පිරිමින් පැය 09 පමණ ද, වැඩ කරනු ලබන බව හෙළි වී ඇත (Rosa,kumuduini,1995;89). මෙහිදී පිරිමින් කරනු ලබන සේවාවන් වෙනුවෙන් වැටුපක් හෝ ආදායමක් ලැබීම සිදුවන නමුත් ගෘහාශ්‍රිත කටයුතු මෙන්ම සහාය නිෂ්පාදක භූමිකාව සඳහා කාන්තාවන් සිදුකරන දායකත්වය සඳහා වැටුප් ගෙවීමක් සිදු නොවේ. බහුවිධ භූමිකාවන් ඉටුකරන ශ්‍රී ලාංකික කාන්තාව සම්ප්‍රදාය රැකීමේ ආරක්ෂකයන් මෙන්ම පවුල පවත්වාගෙන යාමේ වගකීම්ද දරනු ලබයි. මාක්ස්වාදී කාන්තාවාදීන් විසින් පෙන්වා දෙනු ලබන පිරිමින් නිෂ්පාදන ක්‍රියාවලියටත් කාන්තාවන් එම නිෂ්පාදිතය පරිභෝජනය කරන්නන් ලෙසත් වෙන්කොට සැලකීම මේ තුළ මනාව පැහැදිලි වේ.

## කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය තුළින් කිසිදු භේදයකින් තොරව සියළු දෙනාටම සමාන අයිතිවාසිකම් හිමිවිය යුතු බව දක්වා ඇතත් කාන්තාවන්, ළමුන්, කම්කරුවන්, වර්ණභේදවාදයෙන් පීඩා විඳින්නන්ගේ ආදී කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තවදුරටත් විවිධ ක්‍රියා මාර්ග ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට සිදු විය. මේ අනුව 1979 දී කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ සම්මුතිය (Convention On the Elimination of All Forms of Discrimination Against women /CEDAW) සම්මත කරන ලද අතර 1981 සිට එය ක්‍රියාත්මක කෙරිණි. මෙම සම්මුතියට රටවල් 165 අත්සන් තබා අනුමත කර ඇති අතර රටවල් 25 විසින් අනුමත කිරීම හෝ අත්සන් තැබීම සිදුකර නොමැත. මෙම සම්මුතිය අනුමත කර තිබෙන රටවල් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ තත්ත්වය සමාන මට්ටමකට (Gender Equality) පත්කිරීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගනු ලබමින් සිටී.

ජෝර්දානයේ මේ වන විට පවුලේ ගෞරවය සඳහා (Honour killing) කාන්තාවන් ඝාතනය කිරීමේ සිරිත අවලංගු කිරීම සඳහා නීති සකස් කිරීමට යෝජනා කර ඇත. මෙය කාන්තා නිදහස වෙනුවෙන් රජයක් විසින් සිදු කරන ඉතා වැදගත් කර්තව්‍යයකි. මන්දයත් කාන්තාවගේ ජීවත්වීමේ අයිතිය මේ මගින් තහවුරු කිරීමට අවස්ථාව සැලසෙන හෙයිනි.

දෑවැදි නිසා සිදුවන මරණ වැළැක්වීමට ඉන්දියාව බංග්ලාදේශය වැනි රටවල නීති පනවා ඇත. 1961 දී ඉන්දියාවේ දෑවැදි තහනම් කිරීමේ පනත (Bill of Dowry prohibition) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළද සම්මත කිරීමට නොහැකිවූ අතර 1980 දී Pramila Dantavate විසින් දෑවැදි ඉල්ලීම තහනම් කිරීම සම්බන්ධව පෞද්ගලිකව පනතක් ඉදිරිපත් කළාය. 1982 අගෝස්තුවල මෙම පනතේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමට පත්කළ පාර්ලිමේන්තු ඒකාබද්ධ කමිටුව විසින් ඔවුන්ගේ වාර්තාව ලෝක් සභාවට ඉදිරිපත් කරන ලදී. ඉන්දියානු නීති කොමිෂම විසින් මෙය (Dowry Deaths, and Laws Reform) "දායාද මරණ සහ නීති සංශෝධන පනත" නමින් නම් කරමින් 1984 දී සංශෝධනයට ලක් කර 1986 දී සම්මත කරන ලදී. මේ මගින් දායාද සම්බන්ධව සිදුවන කාන්තා මරණවලදී අදාළ පාර්ශවයන්ට දඬුවම් පැමිණවීමත්, ඇයගේ දේපළ ළමුන්ට හෝ දෙමාපියන්ට නැවත පැවරීමටත් නියමිත විය (Forbes,1998; 247-248). 1986 දී රජිව් ගාන්ධිගේ කොංග්‍රස් ආණ්ඩුව මුස්ලිම් කාන්තාවන්ගේ දික්කසාදය සම්බන්ධව "Muslim women's protection of rights in divorce bill" හඳුන්වා දුන්නත් පාර්ලිමේන්තුවෙන් පිටත සිටි ඇතැම් කාන්තා කොටස් එයට විරුද්ධවීමෙන් එය නීතිගත වීම සිදු නොවීය. කෙසේ වූවද දායාද මරණ ඉන්දියාව තුළ තව දුරටත් සිදුවෙමින් පවතී. මෙවැනි තත්ත්වයන් දුරලීම සඳහා නීතිමය වශයෙන් ප්‍රතිපාදන සපයා ඇතත් සිවිල් ජනසමාජයේ සාමාජිකයන්ගේ ආකල්ප මානව අයිතිවාසිකම් වෙනුවෙන් එතරම් සම්පූ නොවීම තවදුරටත් කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමට බලපානු ලබන ප්‍රධාන සාධකයක් වශයෙන් හඳුනාගත හැකිය.

කාන්තා දේශපාලන සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා නීතිමය වශයෙන් ඇතැම් රාජ්‍යයන් කාන්තාවන් සඳහා පාර්ලිමේන්තුව සහ වෙනත් නියෝජිත ආයතන තුළ නිශ්චිත පංගු ක්‍රමයක් නිරණය කර ක්‍රියාවට නගමින් සිටී. ඉන්දියාවේ 1993 සම්මත කළ පංචායත් රාජ්‍ය පනත මගින් මට්ටම් 3කින් යුත් පංචායත්වල 33% ආසන්න ප්‍රමාණයක් කාන්තාවන්ට වෙන්කරන ලදී. 1998 පංචායත් මැතිවරණයේදී බොහෝ ප්‍රාන්ත රාජ්‍යවල ආසන 33%-40% අතර ප්‍රමාණයක් කාන්තාවන් විසින් ජයග්‍රහණය කරන ලදී. පිලිපීනයේ තෝරා ගන්නා කාන්තාවන් නියෝජිතයන් ප්‍රමාණය මෙන්ම ගුණාත්මක බවද වර්ධනය කිරීමට වැඩි වැදගත්කමක් ලබා දී ඇත.

කාන්තා අයිතිවාසිකම්වලට එරෙහිව පවතින රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්කිරීමේ ක්‍රියාදාමයක් ඇතැම් රටවල ක්‍රියාත්මක වෙමින් පවතී. 2000 පෙබරවාරි මාසයේ සම්මතවූ නීතියක් මගින් මිසරයේ කාන්තාවන්ට තම සැමියාගේ කැමැත්ත නොමැතිව දික්කසාදය ලබාගත හැකිය. නඩත්තු ගාස්තු නොගෙවන්නේනම්, ඔහුගේ වැටුපෙන් එම මුදල අඩු කරගැනීමට උක්ත නීතිය තුළින් ඉඩ සලසා ඇත. 1995 දී බොට්ස්වානා හි පුරවැසි පනතට ගෙන එන ලද සංශෝධනයක් මගින් විදේශිකයන් සමඟ විවාහවන ස්ත්‍රීන්ගේ දරුවන්ට තම මවගේ රටේ පුරවැසිභාවය ලබාගැනීමට ඇති අයිතිය පිළිගැනිණි. මෙවැනි ක්‍රියා මාර්ග තුළින් ලොව බොහොමයක් රටවල කාන්තා අයිතවාසිකම් ආරක්ෂාකිරීමට උත්සාහ දරනු ලබයි.

මෙයට අමතරව සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන ආදිය විසින්ද කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි. බොහෝ රටවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය ලබාදෙන වැඩසටහන්, දේශපාලන පක්ෂ සහ පාර්ලිමේන්තු අසුන්වල නියමිත පංගු ප්‍රමාණයක් කාන්තාවන්ට වෙන්කිරීම සඳහා සිදුකෙරෙන ව්‍යාපාර ආදිය සිදුවෙමින් පවතී. ටිබැට් සහ බ්‍රිතාන්‍යවල 1996 පළාත්පාලන මැතිවරණයේදී රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් විසින් මැතිවරණ අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත්වීමට කාන්තාවන් 300 ක් පුහුණු කිරීම මීට උදාහරණ වේ.

වර්තමානය වන විට රාජ්‍ය මෙන්ම රාජ්‍යනොවන සංවිධානද විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට උත්සාහ ගනිමින් සිටී. ලංකාවේ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ සලකා බැලීමේදී ව්‍යවස්ථාව තුළ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු දෙනාටම අයිතිවාසිකම් හිමි වියයුතු බව දැක්වීම, කාන්තා කටයුතු සම්බන්ධව කාන්තා කාර්යාංශය පිහිටුවීම, ළමුන්ට හා කාන්තාවන්ට සිදුවන අසාධාරණයන් සම්බන්ධව පැමිණිලි කිරීමට දිවයිනේ ප්‍රධාන නගරවල පොලිසිවලට අනුබද්ධව ළමා හා කාන්තා කාර්යාංශ පිහිටුවීම කාන්තා ප්‍රඥප්තිය සම්මත කිරීම, ස්ත්‍රී දූෂණ සම්බන්ධව බලපාන නීති පද්ධති ප්‍රතිසංස්කරණයට ලක් කිරීම ආදිය සිදු කර ඇති බව පෙනේ.

මේ ආකාරයට රජය සහ රාජ්‍යනොවන ආයතන විසින් කාන්තා අයිතිවාසිකම් මෙන්ම මානව අයිතිවාසිකම් කඩවීම් වැලැක්වීම සඳහා විවිධ ක්‍රියාකාරකම් දේශීය හා විදේශීය වශයෙන් ගෙන ඇතත් සිවිල් සමාජයේ පවතින අඩුලුහුඩුකම් මෙන්ම රාජ්‍ය අංශයෙන් සිදුවන නොසලකාහැරීම්, ප්‍රමාදයන් සහ වගකීම් පැහැරහැරීම් තුළින් තව දුරටත් මානව අයිතිවාසිකම් මෙන්ම කාන්තා අයිතිවාසිකම්ද කඩවෙමින් පවතී.

## නිගමන

කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සිදුකෙරෙන සාකච්ඡා වර්තමානය වනවිට විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ ඉහළ තලයකට පැමිණ ඇත. රාජ්‍ය හා රාජ්‍ය නොවන මට්ටමින් විවිධ දැනුවත්කිරීම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නීති සංශෝධනය කිරීම්, කාන්තා කාර්යාංශ පිහිටුවීම, පොලිස් ස්ථානවල කාන්තා පැමිණිලි ඒකක පිහිටුවීම, නීති සහන සේවා සහ උපදේශක සේවා සැපයීම ආදිය සිදුකරනු ලබයි.

මේ ආකාරයේ කුමන මැදිහත්වීම් සිදු වුවද තව දුරටත් කාන්තා අයිතිවාසිකම් කඩවෙමින් පවතින බව පෙනේ. එයට හේතු ලෙස තව දුරටත් සිවිල් සමාජයේ පවතින නොදැනුවත්කම, උපදේශන සේවාවන් සහ නීතිසේවාවන් ප්‍රාදේශීය මට්ටම දක්වා ගලා නොයෑම, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවන් ග්‍රාමීය මට්ටමට ගලා නොයෑම මෙන්ම යම් ආකාරයකින් එම සාකච්ඡාවන් ගම් මට්ටමට ගිය ද ගැමි සහ පහළ මට්ටමේ සමාජය තුළ වෙසෙන පුද්ගලයින්ට සම්පවීමට එම දැනුම ගෙන යන සම්පත්දායකයින්ට නොහැකිවීම ද පෙන්වා දිය හැක. එමෙන්ම යම් ආකාරයකින් දැනුවත් භාවයක් ලැබුවත් කාලාන්තරයක් තිස්සේ පැවත ගෙන එන ආකල්ප සහ විශ්වාසයන් නිසා කාන්තා අයිතිවාසිකම් නොසලකා හැරීමට ලක්වන අවස්ථා ද ඇත.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.


ගුණසේකර එස් (2000), සමාජ විමසුම, දකුණු ආසියාතික සමාජයේ කාන්තාව සමාජීය විද්‍යා අධ්‍යයන කේන්ද්‍රය, පේරාදෙණිය.

ජයවීර, එස් (1995),වෙනසක පැතිකඩ, (සංස්:) කාන්තාව සහ සේවා නියුක්තිය කාන්තා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ 05.

ද සිල්වා ,ඩී (1996), බාලවයස්කාර අම්මලාගේ කථාව: බංග්ලාදේශය ඇය 2, කලාපය.

ද සිල්වා ,ඩී (1996), ලිංගික සූරාකෑමකට ලක්වන නේපාල ස්ත්‍රීන්, ඇය 3 කලාපය.

රණතුංග, ඒ.එස්, අබේසේකර,ගොවිතැනෙහි ලාභදායීතාවය සහ ඩබ්.ජ්.ටී.(1977), සම්පත් භාවිතය, පර්යේෂණ අධ්‍යයන අංක 23, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ - 07.

සරත්චන්ද්‍ර, ඩබ්ලිව්.ඒ (2000), සමාජ ප්‍රශ්න විමසුම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ - 10.

Amarasuriya, Nimala, R.(1991). Women and Technology, Working paper No.3, CENWOR , Colombo.

Central Bank of Sri Lanka (2002). Economic and Social Statistics of Sri Lanka , Central Bank, Sri Lanka.

Department of Agriculture (2000). Crop Enterprise Budget : Socio Economic & Planning Center, Dept. of Agriculture. Peradeniya .

Department of Census (2002). Quartely Report of the Sri Lanka Labour Force Survey- 3rd Quarter, Dept. of Census,Colombo.

Department of Census (2000). Annual Report of the Sri Lanka Labour Force Survey – 2000, Dept. of Census, Colombo.

Dixit, M (1998). Woman and Achivement: Dynamics of Participation and Partnership, New Delhi : Kanishka publishers.

Engels, Friedrich (1972). The Origin of the Family, Private Property and the State, (reprint), International publishers.

Forbes, G, (1998). The Cambridge History of India: Women in Modern India, New Delhi : Cambridge University Press.

Gamage , D (2003). Gender and Development Situation in Sri Lanka; Paper presented at the Gender and Development Workshop, Organized by SAARC Human Resources Development Center, Islamabad, Pakistan , 5-19th October 2003.

Gunawardena, Lalitha (1995). An Areaof Darkness ; Time Use Research on Women's Contribution to Agriculture in Facing Odds; Women in the Labour Market, CENWOR, Colombo.

Rosa, Kumuduini (1995). Women of South Asia, Gala Academic Press, Friedrich Stiftung, Colombo.

Senanayake, S.M.P, & Wijetunga, L.D.I., (1987). A Study on the Employment Generation in Kirindi - Oya Irrigation and Settlement Area Colombo. ( ARTI Research Study No. 79).

Sepala, A.C.K, Gamage, D & Senakaarachchi, R.B (1988). Productivity & Employment Implications of Small Scale Farming , CIRDAP, Dhaka, Bangladesh.

Sirisena, W.H. (1986). Invisible Labour: a Study of Women's Contribution in Agriculture in Two Traditional Villages in the Dry Zone in Sri Lanka, in Modern Sri Lanka Studies, Peradeniya.

Tong, Rosemarie (1992). Feminist Thought - a Comprehensive Introduction, London, Routledge.

UNDP (2000). Human Development Report - 2000, Newyork : UNDP.

UNDP (2002). Human Development Report – 2002, Newyork : UNDP.